ස.සේ.කො වක්‍රලේඛ : 03/2022 (සම්මුඛ පරීක්ෂණ)

මගේ අංකය : ස.සේ.කො./01/iv වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2022.11. 09

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

## බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ගණනය කිරීම.

ලිඛිත විභාග වලින් පරිබාහිරව සමුපකාර සේවක බඳවාගැනීම් සඳහා සිදු කරන සම්මුඛ පරීක්ෂණ වලදී මෙහි සඳහන් උපදෙස් හා උපලේඛන 01 හි දක්වා ඇති ලකුණු ගණනය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කළ යුතු බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩල දැනුවත් කරන ලෙස 2022.10.19 දිනැති සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දන්වනු ලැබේ. මෙම විධි විධාන 2022.12.01 දින සිට ක්‍රියාත්මක වන අතර ඒ අනුව ස.සේ.කො. 05/2015 (සංශෝධන) වක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

02. පහත සඳහන් ක්‍රමවේදය අනුව ලකුණු ලබා දිය යුතු අතර එක් එක් සුදුසුකම සඳහා ලකුණු ගණනය කළ යුතු ආකාරය උප ලේඛණ 01 හි දක්වා ඇත.

| | සලකා බලන අතිරේක සුදුසුකම් | ලකුණු |
|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද<br>(අතිරේක සේවා කාල සඳහා) | 40 |
| 02 | අදාල තනතුරෙහි වැඩ බැලීම | 05 |
| 03 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 04 | වෘත්තීය සුදුසුකම් | 25 |
| 05 | වෙනත් කුසලතා | 10 |
| | මුළු ලකුණු සංඛ්‍යාව | 100 |

03. සේවා පළපුරුද්ද සඳහා ලකුණු ගණනය කිරීමේදී ස.සේ.කො. 03/2020 වක්‍රලේඛයේ 7.8.1 ඡේදයෙහි විධි විධාන වෙනුවට මෙහි උපලේඛන 01 හි 01 ඡේදයේ සඳහන් විධි විධාන ආදේශ කරනු ලැබේ. අවශ්‍ය වන්නේ නම් අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා 03/2020 වක්‍රලේඛයේ බාහිර බඳවා ගැනීම් සඳහා වන සුදුසුකම් සලකා බැලීමට බාධාවක් නොමැත. එසේ වුවත් අභ්‍යන්තර සේවකයන් ලෙස සලකා ලකුණු ගණනය කළ යුත්තේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය මත සේවයේ යෙදෙන්නන් සඳහා පමණි.

04. සෑම අයදුම්කරුවෙකුම පූර්ණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම ඇගයීම් කළ යුතු අතර ලකුණු සටහන් කිරීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර ලෙස අවශ්‍යතාවය පරිදි ඇමුණුම 1 හෝ ඇමුණුම 2 ලේඛණයක් පමණක් භාවිතා කළ යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වෙන වෙනම ලේඛණවල ලකුණු සටහන් කොට ඒකාබද්ධ ලේඛණයක් සකස් කිරීම අවශ්‍ය නොවේ. නමුත් ලකුණු අනුපිළිවෙල අනුව අභ්‍යන්තර හා බාහිර අයදුම් කරුවන් සඳහා වෙන වෙනම ප්‍රමුඛතා ලේඛන සකස් කළ යුතුය.

05. තනතුරට අදාල මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා උපයෝගී කරගන්නා ලද අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් පිලිබඳ සහතික සඳහා ලකුණු ලබා නොදිය යුතුය.

උපලේඛන 01

## 01. සේවා පළපුරුද්ද (අතිරේක සේවා කාල සඳහා) - උපරිම ලකුණු 40

සේවා කාලය ගණනය කිරීමේදී ස.සේ.කො. 03/2020 චක්‍රලේඛයේ 7.8.1 ඡේදයෙහි විධි විධාන වෙනුවට පහත සඳහන් විධි විධාන ආදේශ කරනු ලැබේ.

අභ්‍යන්තර සේවකයෙකු සේ සලකා අදාල තනතුරට බඳවා ගැනීමේදී සේවා පළපුරුද්ද ලෙස මෙම චක්‍රලේඛයේ බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සම්පූර්ණ කළ යුතු සේවා කාලය හැර ඉතිරි සේවා කාලය සඳහා පමණක් පහත එක් එක් වැටුප් කේත අංක අනුව උපරිම වශයෙන් ලකුණු 40 ක් ලබාදිය හැකිය.

| වැටුප් කේත අංකය | ලකුණු | |
|---|---|---|
| | වසරක සේවා කාලයක් සඳහා | මාස 06 වැඩි වසරකට අඩු සේවා කාලයක් සඳහා |
| MEL | 05 | 2.5 |
| TSL | 04 | 02 |
| SL | 03 | 1.5 |
| OL | 02 | 01 |
| MSSL(T) / MSSL | 01 | 0.5 |

## 02. අදාල තනතුරෙහි වැඩ බැලීම - උපරිම ලකුණු 05

කොමිෂන් සභා අනුමැතිය මත වැඩ බැලීමේ කාලය සඳහා පමණක් ලකුණු ගණනය කළ යුතුය. මාස 03 ට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

| වැඩ බැලීමේ කාලය | ලකුණු |
|---|---|
| මාස 03 සිට 06 දක්වා | 01 |
| මාස 06 සිට වසර 01 දක්වා | 03 |
| වසර 01 කට වැඩි | 05 |

## 03. අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 20

තනතුරට අදාල මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා උපයෝගී කරගන්නා සහතික සඳහා හෝ මූලික සුදුසුකම්වලින් පහළ සුදුසුකම් සඳහා ඉදිරිපත් කරන සහතික සඳහා ලකුණු ලබා නොදිය යුතුය

### 3.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය - උපරිම ලකුණු 10

දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් විය යුතුය. MSSL(T) හෝ MSSL වැටුප් කේත අදාල වන තනතුරු සඳහා බඳවා ගැනීමේ දී පමණක් මෙම සහතික සඳහා ලකුණු ලබා දිය යුතුය.(දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සමත්වීම සලකා බලනු ලැබේ.)

| සාමාර්ථය | ලකුණු |
|---|---|
| අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීම | 01 |
| විෂයයන් 01 ක් හෝ වැඩි ගණනක සාමාර්ථය | 02 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුලුව විෂයන් 03 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 04 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුලුව විෂයන් 04 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 06 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුලුව විෂයන් 05 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 08 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුලුව විෂයන් 06ක් හෝ ඊට වැඩි ගණනකට සම්මාන සහිතව විෂයයන් 07 කින් හෝ ඊට වැඩි විෂයයන් ගණනකින් සමත්වීම | 10 |

### 3.2. අ.පො.ස. (උ.පෙ) විභාගය - උපරිම ලකුණු 10

ඕනෑම විෂය ධාරාවකින් එකවර සමත් විය යුතුය.

| සාමාර්ථය | ලකුණු |
|---|---|
| විෂයයන් 03 කින් සමත්වීම | 05 |
| සම්මාන 01 ක් සමග හෝ ඊට වැඩියෙන් සමත්වීම | 10 |

### 3.3 උපාධි පාඨමාලා සහතික - උපරිම ලකුණු 10

| උපාධි සහතිකය | ලකුණු |
|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ඉල්ලුම් කර ඇති විෂය ක්ෂේත්‍රයට අදාලව ලබාගත් උපාධි සහතිකය | 10 |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ඕනෑම විෂය ධාරාවක් යටතේ ලබාගත් උපාධි සහතිකය | 06 |

## 04. වෘත්තීය සුදුසුකම් - උපරිම ලකුණු 25

4.1 සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය /සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය - උපරිම ලකුණු 10

| වෘත්තීය සුදුසුකම් | සාමාර්ථය සඳහා ලකුණු | | | | උපරිම ලකුණු |
|---|---|---|---|---|---|
| | පළමු පෙළ | දෙවන පෙළ | තෙවන පෙළ | සාමාන්‍ය | |
| සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය | 05 | 04 | 03 | 02 | 05 |
| සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය | 05 | 04 | 03 | 02 | 05 |

4.2 ඉල්ලුම් කර ඇති විෂය ක්ෂේත්‍රයට අදාලව පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර/ ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලා - උපරිම ලකුණු 15

| පාඨමාලාව | පාඨමාලා කාලය | එක් පාඨමාලාවක් සඳහා ලකුණු | එක් පාඨමාලාවකට වඩා හදාරා ඇත්නම් | ලකුණු සංඛ්‍යාව | උපරිම ලකුණු |
|---|---|---|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලාව | මාස 06 කට නො අඩු | 01 | 02 ට වැඩි | 02 | 05 |
| | මාස 09 කට නො අඩු | 02 | 02 ට වැඩි | 03 | |
| | වසර 01 හෝ ඊට වැඩි | 03 | 02 ට වැඩි | 05 | |
| ඩිප්ලෝමා පාඨමාලාව | මාස 09 කට නො අඩු | 03 | 01 ට වැඩි | 04 | 05 |
| | වසර 01 හෝ ඊට වැඩි | 04 | 01 ට වැඩි | 05 | |
| උසස් ඩිප්ලෝමා පාඨමාලාව | වසර 01 හෝ ඊට වැඩි | 05 | 01 ට වැඩි | 10 | 10 |

*4.2 සඳහා ලබා දිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 15කි.

**05.** <u>වෙනත් කුසලතා - උපරිම ලකුණු 10</u>

| කුසලතාව/හැකියාව | | කුසලතා මට්ටම | අවස්ථා ගණන | උපරිම ලකුණු |
|---|---|---|---|---|
| 5.1 | ක්‍රීඩා කෞශල්‍යය | පාසැල්/කලාප/පළාත්/ජාතික මට්ටමේ ක්‍රීඩා සහතික | 01 | 01 |
| 5.2 | භාෂා හැකියාව | අ.පො.ස. (සා.පෙ) / (උ.පෙ. )/ ඉංග්‍රීසි/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා සම්මාන හෝ ඉහල සාමාර්ථයක් ලබා තිබීම හෝ<br>පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඉංග්‍රීසි/ දෙමළ භාෂා සහතිකපත්‍ර / ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | 01 | 02 |
| | | උපාධිය සඳහා ඉංග්‍රීසි/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා තිබීම හෝ ඉංග්‍රීසි/ දෙමළ භාෂා මාධ්‍යයෙන් උපාධිය හදාරා තිබීම. | 02 | |
| 5.3 | පරිගණක සාක්ෂරතාව | අ.පො.ස. (සා.පෙ)/(උ.පෙ. )/විභාගය සඳහා පරිගණක විෂයය හදාරා සම්මාන හෝ ඊට ඉහල සාමාර්ථයක් ලබා තිබීම හෝ<br>පිළිගත් ආයතනයකින්ලබාගත් මාස 06 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සහතික පත්‍රයක් ලබා තිබීම. | 01 | 04 |
| | | පිළිගත් අයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා අමතර විෂයක් ලෙස පරිගණක විද්‍යාව හදාරා තිබීම. | 02 | |
| | | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම. | 04 | |
| 5.4 | දහම් පාසැල් සහතික | අවසාන සහතික පත්‍රය හෝ ධර්මාචාර්ය විභාග සහතිකය | 01 | 01 |
| 5.5 | වෙනත් කුසලතා | කලාප/ පළාත් මට්ටමේ ක්‍රීඩා නොවන ජයග්‍රහණ (සෞන්දර්ය වැනි) | 01 හෝ ඊට වැඩි | 01 |
| 5.6 | නායකත්වය | පාසැල් ශිෂ්‍යය නායක/ ක්‍රීඩා නායක | 01 | 01 |

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතුව බව ද දැනුම් දෙනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

පිටපත්:

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.

02.ලේකම්,සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය(වයඹ) - කා.දැ.පි.

03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.පි. හා අ.ක.ස.

04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි හා අ.ක.ස.

05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්- කුරුණෑගල/හලාවත/කුලියාපිටිය/මහව - දැ.පි.හා අ.ක.ස.

ඇමුණුම 01

## සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදීම - අභ්‍යන්තර සේවකයින් සඳහා

තනතුර : ..................................................                                        දිනය : ............................................

| නම හා ජාතික හැඳුනුම්පත් අංකය | තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම්/ සේවා පළපුරුද්ද (3/2020 චක්‍ර ලේඛයට අනුව) | | අතිරේක සේවා කාලය / අදාළ තනතුරේ වැඩ බැලීම (45) | | අතිරේක අධ්‍යාපන සුදුසුකම්/ අතිරේක වෘත්තීය සුදුසුකම් (45) | | | වෙනත් කුසලතා සඳහා 3/2022 චක්‍රලේඛයේ උපලේඛන 01 (05) අනුව (10) | | මුළු ලකුණු (100) | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අධ්‍යාපන සුදුසුකම් (සටහන් කරන්න) | සේවා පළපුරුද්ද (සටහන් කරන්න) | සේවා කාලය (40) | වැඩ බැලීම (05) | අධ්‍යාපන සහතික(20) | වෘත්තීය පාඨමාලා සහතික (25) | ලකුණු | කුසලතාවය සටහන් කරන්න | ලකුණු | | |
| | | | | | | | | | | | |

ඉහත නම් සඳහන් අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති සහතික ඇගයීම් කර නිවැරදිව ලකුණු ලබා දී ඇති බවට සහතික කරමු .

**සම්මුඛ පරීක්ෂණ නිළධාරී මණ්ඩලය**

| අනු අංකය | නිළධාරියාගේ නම හා නිත්‍ය තනතුර | තනතුර | අත්සන |
|---|---|---|---|
| 01. | | සභාපති | |
| 02. | | සාමාජික | |
| 03. | | සාමාජික | |
| 04. | | සාමාජික | |
| 05. | | සාමාජික | |
| 06. | | සාමාජික | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)

ඇමුණුම 02

# සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදීම - බාහිර සේවකයින් සඳහා

තනතුර : ..................................................

දිනය : ............................................

| හා ජාතික හැඳුනුම්පත් අංකය | පදිංචිය | තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම්/ සේවා පළපුරුද්ද (3/2020 චක්‍ර ලේඛයට අනුව) | | අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 45) | | | වෙනත් කුසලතා හා දැනුම සඳහා 3/2022 චක්‍රලේඛයේ උපලේඛන 01හි අංක 05 අනුව (උපරිමලකුණු 10) | | | මුළු ලකුණු (A) (උපරිම ලකුණු 55) | ලකුණු ප්‍රතිශතය (100%) * |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යාපන සුදුසුකම් (සටහන් කරන්න) | සේවා පළපුරුද්ද (සටහන් කරන්න) | අධ්‍යාපන සහතික(20) | වෘත්තීය පාඨමාලා සහතික(25) | ලකුණු | අනු අංකය | කුසලතාවය සටහන් කරන්න | ලකුණු | | |
| | | | | | | | | | | | |

ඉහත නම් සඳහන් අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති සහතික ඇගයීම් කර නිවැරදිව ලකුණු ලබා දී ඇති බවට සහතික කරමු .

| අනු අංකය | සම්මුඛ පරීක්ෂණ නිළධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | අත්සන |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)

*ලකුණු ප්‍රතිශතය ගණනය කිරීම $\frac{A \times 100}{55}$ =

ඇමුණුම 03

## සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා උපදෙස්

1. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් නොවන වෙනත් කිසිම අයෙකු සම්මුඛ පරීක්ෂණ අවස්ථාවට සහභාගී කර නොගත යුතුය.

2. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සෑම අයදුම්කරුවකුගේම අනන්‍යතාවය තහවුරු කර ගත යුතුය.

3. සම්මුඛ පරීක්ෂණවල දී අභ්‍යන්තර සේවකයින් සඳහා අභ්‍යන්තර පදනමින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව ස.සේ.කො.03/2020 චක්‍රලේඛයෙහි බාහිර සුදුසුකම් යටතේ දක්වා ඇති සුදුසුකම්ද සළකා බැලිය හැකිය.

4. අභ්‍යන්තර බඳවා ගැනීම්වලදී ස.සේ.කො.03/2020 චක්‍රලේඛයෙහි ඉල්ලුම් කර ඇති සේවා පළපුරුද්ද , ඊට ඉහළ වැටුප් කේත යටතේ සම්පූර්ණ කර ඇති අවස්ථාවකදී, එම අයදුම්කරු නියමිත සේවා කාලය සම්පූර්ණ කරන ලද අයදුම්කරුවෙකු සේ සැළකිය යුතුය.

5. පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අවසාන දිනට මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද සම්පූර්ණ කර තිබිය යුතු අතර අයදුම්පත් කැඳවා ඇති අවසාන දිනට පසුව සම්පූර්ණ කර ඇති සහතික සඳහා (පාඨමාලා) ලකුණු ලබා දීම නොකළ යුතුය.

6. තනතුරකට බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස උපාධිය හෝ වෙනත් වෘත්තීමය/අධ්‍යාපන සුදුසුකම් සමඟ සේවා පළපුරුද්ද සපුරා ගැනීම නියම කර ඇති විට උපාධිය හෝ වෙනත් වෘත්තීමය/අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති නමුත් ඉල්ලුම් කර ඇති පළපුරුද්ද නොමැති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට යොමු කරන්නේ නම් අයදුම්පත් කැඳවා ඇති අවසාන දිනට සම්පූර්ණ කර ඇති සේවා කාලය පිළිබඳ විස්තර ඇතුළත්ව ප්‍රමුඛතා ලේඛනයේ ඒ සම්බන්ධ විශේෂ සටහනක් තැබිය යුතුය.

7. පුරප්පාඩු තනතුරක් සඳහා ඉල්ලුම් කරන සේවා පළපුරුද්ද, එහි සඳහන් වැටුප් කේත අංක දෙකක් යටතේ සම්පූර්ණ කර ඇති අවස්ථාවකදී සේවා කාලය ඇගයීම කළ යුත්තේ ඒ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ඇත්නම් පමණි.

8. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමේ දී චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති සහතික පමණක් සළකා බැලිය යුතුය. එමෙන්ම එම සහතික චක්‍රලේඛයේ සඳහන් ආයතන වලින් ලබාගත් ඒවා විය යුතුය. චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා නොමැති සහතිකයක් සළකා බැලිය හැක්කේ ඇගයීම් මණ්ඩලය/සමිතිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම එම සහතික පිළිගන්නේද යන්න සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගෙන ඇත්නාම් පමණි.

9. සම්මුඛ පරීක්ෂණයේ දී සළකා බැලිය යුත්තේ එම අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලබන සහතික පමණි. සහතික වල මුල් පිටපත් සමඟ සත්‍ය පිටපත් බවට අයදුම්කරු විසින් සහතික කරන ලද ඡායා පිටපත්ද ලබා ගත යුතුය. සහතික පරීක්ෂා කර බලා ලකුණු ලබා දීම සිදු කළ යුතුය.

10. සමිතියට ඉදිරි තීරණ ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් බඳවා ගැනීමට අදාල නිර්දේශ ප්‍රමුඛතා ලේඛනයේ පැහැදිලිව සටහන් කළ යුතු අතර එහි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු නිලධාරීන් අත්සන් තබා නිල මුද්‍රව තැබිය යුතුය.

# ප්‍රමුඛතා ලේඛනය

සමිතිය :

තනතුර :

දිනය :

| අනු අංකය | නම හා ජාතික හැඳුනුම්පත් අංකය | ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

නිර්දේශය :-

විශේෂ කරුණු :-

| අනු අංකය | නම හා නිත්‍ය තනතුර | තනතුර | අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|---|
| 1. | | සභාපති | | |
| 2. | | සාමාජික | | |
| 3. | | සාමාජික | | |
| 4. | | සාමාජික | | |
| 5. | | සාමාජික | | |
| 6. | | සාමාජික | | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)